# 7 ආදි පිතෘ ඊසාක් තුමා



7.1 රූපය - ඊසාක් තුමාගේ උපත

## ඊසාක් තුමාගේ උපත

සමිඳාණන් වහන්සේ වදාළ පරිදි උන් වහන්සේ සාරාට කරුණාව දැක් වූ සේක. උන් වහන්සේ ඇට දුන් පොරොන්දුව ඉටු කළ සේක. සාරා ද පිළිසිඳගෙන දෙවියන් වහන්සේ වදාළ නියමිත කාලයෙහි, ආබ්‍රහම්ගේ මහලු වයසෙහි ඔහුට දව පුත්‍රයකු ලැබුවා ය. ආබ්‍රහම්, තම පුත්‍රයාට ඊසාක් යන නම තැබී ය. ඊසාක් වන තම පුතුට දින අටක් වූ කළ දෙවියන් වහන්සේ අණ කළ පරිදි ආබ්‍රහම් ඔහු චර්මඡේදනය කළේ ය. ඊසාක් උපදින විට ආබ්‍රහම්ට වයස අවුරුදු එකසියයකි. සාරා ද කතා කරමින්, "දෙවියන් වහන්සේ මා හිනැස්සූ සේක. මේ ගැන අසන සියල්ලන් මා සමග සිනාසෙනු ඇත."

(උත්පත්ති 21:1-6)

ආබ්‍රහම්තුමාට හා සාරාට දව ඊසාක් උපත ලබන විට ආබ්‍රහම් තුමාගේ වයස අවුරුදු 100කි. සාරාගේ වයස අවුරුදු 90කි. මෙයින් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේට කළ නොහැකි දෙයක් නැති බව ය. ඒ නිසා අප දෙවියන් වහන්සේ කෙරෙහි අපගේ සම්පූර්ණ විශ්වාසය තැබිය යුතු ය. විශ්වාසයෙන් යාච්ඤා කළ යුතු ය. "ඊසාක්" යන නමෙහි අර්ථය "සිනාසීම" යන්න ය. ඊසාක් තුමා ආදි පිතෘවරයෙක් වෙයි.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.



7.2 රූපය - ඊසාක් තුමා පූජා කිරීම

### ආබ්‍රහම් තුමා ඊසාක් පූජා කිරීම (උත්පත්ති 22:1-19)

දෙවියන් වහන්සේ : ආබ්‍රහම්, නුඹේ එක ම පුත්‍රයා ඊසාක් රැගෙන මොරියා දේශයට යන්න. එහි ගොස් මා පෙන්වන කන්ද මත දවන යාග පූජාවක් මෙන් ඔහු මට ඔප්පු කරන්න.

ආබ්‍රහම් තුමා : පුතා, ඊසාක්, දවන යාග පූජාවක් සඳහා දර ද රැගෙන මොරියා දේශයට යමු.

ඊසාක් : හොඳයි තාත්තේ, මම ඉක්මනින් සූදානම් වෙන්නම්.

ආබ්‍රහම් තුමා : හොඳයි, එහෙනම් පුතා අපි පිටත් වෙමු. (ආබ්‍රහම් තුමා දවන යාග පූජාවට සූදානම් කළ දර ඊසාක්ට දී තම අතට ගින්දර හා පිහිය රැගෙන දෙදෙනා ම එක් ව යන්නට පිටත් වූහ)

ඊසාක් : තාත්තේ, මෙහි දරත් ඇත; ගින්දරත් ඇත; නමුත් පූජාවට බැටළු පැටවා කොහේ ද?

ආබ්‍රහම් තුමා : පුතා, දෙවියන් වහන්සේ ම පූජාව සඳහා බැටළු පැටවා දේවි. (දෙවියන් වහන්සේ වදාළ ස්ථානයට පැමිණි ආබ්‍රහම් තුමා පූජාසනයක් ඉදිකර, පිළිවෙළට දර කෑලි තබා, තම පුත් ඊසාක් බැඳ, පූජාසනය පිට තැනූ දර සෑය මත තැබී ය. ඉන් පසු සිය පුතු මරන පිණිස පිහිය අතට ගත්තේ ය.)

දේවදූතයෙක් : ආබ්‍රහම්, ළමයාට අත නොගසන්න. ඔබේ එක ම පුත්‍රයා පූජා කිරීමට තරම්, ඔබ දේව ගරු බිය ඇත්තකු බව පෙනේ.

(ආබ්‍රහම් තුමා අංවලින් පඳුරක පැටලී සිටි බැටළුවා ගෙන, සිය පුත්‍රයා වෙනුවට දවන යාග  පූජාවක් මෙන් උ‍ග පූජා කළේ ය.)

කානාන් දේශයේ ජනයා කුළුඳුල් දරුවන් දේවපූජා වශයෙන් වෙනත් දෙවිවරුනට ඔප්පු කළහ. ආබ්‍රහම් තුමා ඊසාක් පූජා කිරීමට සැරසුනු විට දෙවියන් වහන්සේ එය වළක්වා බැටළුවකු ඔහුට ලබා දුන් සේක. මෙයින් පෙන්නුම් කරන්නේ එදා පැවති දරුවන් පූජා ලෙස ඔප්පු කිරීමේ චාරිත්‍රය ඉශ්‍රායෙල්වරුන් විසින් නොකළ යුතු බව දෙවියන් වහන්සේ පෙන්වා දෙන බව ය. දේව පොරොන්දුව අනුව ජාතියක් ගොඩනැගීමට සිටි තමාගේ එකම දරුවා පූජා කිරීමට පවා ආබ්‍රහම් තුමා කීකරු වූයේ දෙවියන් වහන්සේ කෙරෙහි තිබූ ප්‍රේමය හා විශ්වාසය නිසා ය.

ඊසාක් තුමා ද තම පියාණන්ගේ අණට කීකරු ව දේව කැමැත්ත ඉටු කිරීම සඳහා අවනත වූ බව පැහැදිලි ය. අප ද ඊසාක් තුමා මෙන් දෙමව්පියනට කීකරු යහපත් දරුවන් විය යුතු ය. දෙවියන් වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ උන්වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් දිවි ගෙවන යහපත් අය විය යුතු බව ය. එදා ආබ්‍රහම් තුමාගෙන් මෙන් ම අද කිතුනු අපගෙන් ද බලාපොරොත්තු වන්නේ, එවැනි කැප වූ යහපත් ජීවිතයකි.

### ඊසාක් තුමා මගින් ගිවිසුම අලුත් කිරීම


ඊසාක්ගේ මෙහෙකරුවන් මිටියාවතේ ළිං කණින විට ඔවුනට එහි දිය උල්පත් සහිත ළිඳක් සම්බ විය. එහෙත් ගෙරාර්හි ගොපල්ලෝ, "මේ වතුර අපගේ ය" කියමින් ඊසාක්ගේ ගොපලුන් සමඟ කලහ කළහ. ඔවුන් තවත් ළිඳක් කැණූ විට ගෙරාර්හි ගොපල්ලෝ ඒ ගැන ද කලහ කළහ. ඊසාක් ඉන්පසු එතැනින් නික්ම ගොස්, තවත් ළිඳක් කැණී ය. එහෙත් ඒ ගැන ඔවුන් කලහ නොකළ බැවින් එය "රෙහොබොත්" යන නමින් හැඳින්විය. ළිඳ මෙසේ හඳුන්වා "දැන් ඉතින් සමිඳාණන් වහන්සේ අපට මේ රටෙහි ඉඩ කඩ දුන් සේක. අපි මේ රටෙහි සමෘද්ධ වන්නෙමු"යි කීහ. පසු ව ඔහු එතැනින් පිටත් ව බෙයර්-ෂෙබාවට ගියේ ය. එම රාත්‍රියෙහි ම සමිඳාණන් වහන්සේ ඔහුට දර්ශනය වී මෙසේ වදාළ සේක. "නුඹ

පිය ආබ්‍රහම්ගේ දෙවිඳාණෝ මම ය. බිය නොවන්න. නුඹ සමග ද මම සිටිමි. නුඹට ආසිරි දෙමි. මාගේ දාසයා වන ආබ්‍රහම් නිසා නුඹේ පෙළපත මම වර්ධනය කරමි. ඊසාක් ද එහි පූජාසනයක් ඉදිකොට, සමිඳාණන් වහන්සේගේ නාමය කියා යාච්ඤා කළේ ය.

(උත්පත්ති 26:19-25)

ඊසාක් තුමාගේ එඬේරුන් ළිං කණින විට ගෙරාර්හි ගොපල්ලෝ, "මේ වතුර අපගේ ය" කියමින් ඊසාක් තුමාගේ ගොපලුන් සමග කලහ කළහ. එහෙත් ඊසාක් තුමා එයට දක්වූ ප්‍රතිචාරය ඉතා වැදගත් ය. ඊසාක් තුමා ඔවුන් සමග සටනට එළඹුණේ නැත. තම එඬේරුන්ට ඊසාක් තුමා අවවාද කළේ වෙනත් තැනක ළිං කැණීමට ය. ඒ අනුව අප ද අන් අය සමග කලහ නොකළ යුතු බවට ඊසාක් තුමා ආදර්ශයක් සපයයි.

දෙවියන් වහන්සේ ඊසාක් තුමා ව දිරිමත් කරමින් ආබ්‍රහම් තුමා සමග ඇති කරගත් ගිවිසුම ඊසාක් තුමා සමග නැවත අලුත් කළ සේක. "බිය නොවන්න, නුඹ සමග ද මම සිටිමි. නුඹට ආසිරි දෙමි. මාගේ දාසයා වන ආබ්‍රහම් නිසා නුඹේ පෙළපත මම වැඩි වර්ධනය කරමි" කියමින් දෙවියන් වහන්සේ ඊසාක් තුමා ව ශක්තිමත් කළ සේක.



අද අප ජීවත් වන පවුල තුළදීත් පාසල තුළදීත් සමාජය තුළදීත් මතු වන ගැටලුවලට විසඳුම වන්නේ, සාමකාමී දිවි පෙවතක් අනුගමනය කිරීම බව ඊසාක් තුමා අපට මතක් කර දෙයි.

**ක්‍රියාකාරකම**

1. "ඊසාක්" යන්නෙහි අර්ථය කුමක් ද?
2. නිවස තුළ ඔබගේ දෙමව්පියන්ට කීකරු යහපත් දරුවෙක් ලෙස ක්‍රියා කළ හැකි ආකාර **තුනක්** ලියන්න.
3. ඔබගේ ජීවිත ගැටලුවල දී සාමකාමී ලෙස ක්‍රියා කිරීම සඳහා ඔබ තුළ තිබිය යුතු යහපත් ගුණාංග **තුනක්** ලියන්න.
4. ඊසාක් තුමා තුළ තිබූ යහපත් ගුණාංග **දෙකක්** ලියන්න.
5. ඊසාක් තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ **තුනක්** ලියන්න.



**ජීවිතයට බිඳක්**

- *දෙමව්පියන්ට කීකරු යහපත් දරුවෙක් වන්න.*
- *අන් අය සමග සහයෝගයෙන් කටයුතු කරන්න.*
- *ජීවිතයට පැමිණෙන දුක් කරදර ඉවසීමෙන් දරා ගැනීමට හුරුවන්න.*